# මම දිනනවමයි



කේ.ජී. නිසිනි දිසෙල්යා අඹවත්ත

# මම දිනනවමයි

කේ.ජී. නිසිනි දිසෙල්යා අඹවත්ත
කතෘ

## කතෘගේ වෙනත් කෘති

පලමු දිගහැරුම

මහාමායා බාලිකා විද්‍යාලය
4 ශ්‍රේණිය
08.02.2025

ISBN 978-624-208-731-3

# පිදුම

උත්සාහයෙන් නැගී සිටින්නා වූ මගේ ආදරණීය යහළුවන් සියලු දෙනා වෙත සෙනෙහසින් පිලිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි .පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළිගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **''හෙරණ ගත්කරණී''** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර

මලිත් කියන්නේ හැම දේටම දක්ෂ ළමයෙක්. මලිත් පිහිණුම් ක්‍රීඩාව කරන්න හරිම කැමතියි.

මේ මාසයේ අන්තිම සතියේ මලිත්ට පිහිණුම් තරගයක් තියෙනවා. ඒකට මලිත් බබාත් සහභාගී වෙන්න තමයි ලෑස්තිය. ඒත් මලිත් ටිකක් බයෙන් ඉන්නවා එයාට දිනන්න පුළුවන් වෙයිද කියලා.



මලිති හැම වෙලාවෙම එයාගේ පවුලේ අයගෙන් අහන්න ගත්තා එයාට පිහිණුම් තරගය දිනන්න පුළුවන් වෙයිද කියලා.

පලමුවෙන් එයා අම්මා ලගට ගියා. අම්මාගෙන් මෙහෙම ඇසුවා.

අනේ අම්මේ, මට පුළුවන් වෙයිද මේ තරගය දිනන්න?.

අම්මා මලිතිව බදා ගත්තා. පසුව මෙහෙම කිව්වා.

පුතේ, ක්‍රීඩාවක් කරනවා කියන්නේ අපිට ලැබෙන ජය පැරදුම එක සේ දරා ගන්න පුරුදු පුහුණු වෙන එකට

ඒ වුනත් අපි යම් කිසි දෙයක් කරනකොට දැඩි අධිෂ්නයකින් කරනවනම් අපිට දිනන්න බැරිකමකුත් නෑ.



මලිති එයාගේ තාත්තා ළඟට දුවගෙන ගිහින් මෙහෙම ඇසුවා.

“අනේ තාත්තේ මම පැරදෙයි කියලා මට බයයි.”

තාත්තා මලිතිට මෙහෙම කිව්වා.

“නෑ පුතේ ඔයා දිනනවා. මම ඔයා ගැන දන්නවානේ....”

මලිති එයාගේ කාමරයට ගියා.



දින කිහිපයක් ගත වුණා. හෙට තමා තරඟය තියෙන්නේ. මලිති එයාගේ අයියා එක්ක සෙල්ලම් කරමින් සිටියා.

තාත්තා මලිතිට මෙහෙම කිව්වා.

“දැන් වෙලාව හයයි. සෙල්ලම නතර කරලා මූණ කට සෝදගෙන හෙට තරගෙට ඔ◌ිනේ දේවල් ලෑස්ති කරගන්න.”

මලිති ඇඟ සෝදගෙන කාමරයට ගියා. මලිති තරගයට රැගෙන යාමට උවමනා දේවල් ලෑස්ති කරන ගමන් මෙසේ සිතුවා.

"හෙට තරඟයට මම හොඳින් මුහුණ දෙන්න ඕනේ. අම්මා කිව්ව දේවල් මම හොඳින් මතක තියාගන්න ඕනේ තරගයක් කියන්නේ ජය පැරදුම දෙකම ලැබෙන දෙයක්"

මලිති අම්මාට, තාත්තාට වැඳ නින්දට ගියා.



මලිති උදෑසනම සතුටින් අවදිවුණා. මූණ කට සෝදාගෙන ලෑස්ති වුණා. මලිති අම්මා සමඟ උදේ ආහාරය ගත්තා. ඉන් පසුව බුදුන් වැද අම්මාට, තාත්තාට සහ අයියාට වැද ආශිර්වාද ලබාගත්තා. සියළු දෙනාම සතුටින් ගමන යෑමට පිටත් වුණා. මලිති සිටියේ හරිම සතුටින්.

මලිති සහ පවුලේ අය තරඟය පැවැත්වෙන ස්ථානයට ළගාවුණා. ළමයි විශාල පිරිසක් තරඟයට සහභාගි වෙලා සිටියා.

තරඟ වට කිහිපයක් පැවැත්වුණා. සියළු දෙනාම ඒදෙස ආසාවෙන් බලා සිටියා.

දැන් පැවැත්වෙන්නේ මලිත්ගේ තරඟ වටයයි.

මලිත් පිහිණුම් තටාකය අසලට ගියා. අම්මා ,තාත්තා සහ අයියා මලිත් දෙස සතුටින් බලා සිටියා. මලිත්ගේ තරඟය ආරම්භ වුණා.



මලිති තමාට හැකි උපරිමෙන් තම දක්ෂතාවය පෙන්නුවා. සියළු දෙනාම පසුකර ඇය ඉදිරියටම පිහිනුවා. අවසානයේ දී මලිති තරඟය ජයග්‍රහණය කළා.



මලිත්ට දැන් හරිම සතුටුයි. ඒවාගෙම මලිත්ගේ අම්මාට තාත්තාට සහ අයියාටත් මලිත් ගැන හරිම සතුටුයි.

දෙමව්පියන්ගේ උපදෙස් පිළිගත යුතු බවත් තමන් උනන්දුවෙන් සහ කැපවීමෙන් වැඩ කලොත් සියළු දේ ජය ගැනීමට පුළුවන් බව මලිත් තේරුම් ගත්තා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකික්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇතිබව පර්යේෂණාත්මක ව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසී පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේඛම්